# නිවේදන අංක - R/2025/15

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණියට සහ පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව, උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/31/01/Appoint.Gen දරණ 2025.08.25 දිනැති ඉල්ලීම් ලිපියට අනුව, උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු විසි හතක් (27) සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය, උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2025 නොවැම්බර් මාසයේ දී** යාපනයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.10.17** වේ.

| තනතුරු නාමය | තනතුරු අංකය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025 | **01** | **27** |
| කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025 | **02** | |

### 01. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

01.1. උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015.02.20 දින අනුමත කරන ලද 2013.01.01 දින සිට බලපැවැත්වෙන කෘෂිකර්ම උපදේශක සේවයේ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසි සහ එහි සිදුකරන ලද සංශෝධනවලට අනුව, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති යනාදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් **කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණියට හෝ පුහුණු ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

01.2. විවෘත තරඟ විභාගය මගින් පත්වීමක් සඳහා තෝරාගන්නා අපේක්ෂකයන් පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ** තනතුරට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

01.3. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

01.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

01.5. විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන අපේක්ෂකයින්ගේ මුළු එකතුව **විසි හතකි (27).** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## **02.** වැටුප් පරිමාණය

### **02.1** <u>කෘෂිකර්ම උපදේශක තනතුරේ III ශ්‍රේණිය සඳහා</u>

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 3-2025** වැටුප් කේතය අනුව කෘෂිකර්ම උපදේශක සේවයේ III ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.52,250 - 10 X 800/= - 11 X 1,190/= - 10 X 1,320/= - 10 X 1,350/= - 100,040/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

### **02.2** <u>කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණිය සඳහා</u>

මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියෙහි නියම කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව, එම චක්‍රලේඛයේ **V වන උපලේඛනයෙ හි** පරිමාණයට සමාන වර්තමානයේ බලපැවැත්වෙන අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව, **VI වන උපලේඛනයෙ** හි නියම කර ඇති පරිදි පුහුණු ශ්‍රේණිය සඳහා දීමනාව ලෙස **රු.41,317/=** ක ගෙවනු ලැබේ.

| | | |
|---|---|---|
| 1 වන වසර | - | රු.41,317.00 (මාසිකව) |
| 2 වන වසර | - | රු.41,689.00 (මාසිකව) |

## **03.** සාමාන්‍ය සුදුසුකම්

03.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

03.2. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

**(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය)**

03.3. අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

03.4. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

03.5. උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ NP/31/01/Appoint.Gen දරණ 2025.09.12 දිනැති නිර්දේශය මත උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/AS/Agri/Approval/2025 දරණ 2025.09.29 දිනැති ලිපියෙන් ලබාදුන් අනුමැතිය ප්‍රකාරව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 35** ට **නොවැඩි** විය යුතුය.

## 04. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

**අයදුම්කරු තමා අයදුම්කරන තනතුරු නාමයට අදාළව සඳහන් කර ඇති සුදුසුකම්, පහත සඳහන් පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.**

### 04.1 කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට අදාළ සුදුසුකම්

### 4.1.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව හෝ සාහිත්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි හෝ ඉංග්‍රීසි සාහිත්‍ය), ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා විෂයය ධාරාවෙන් ජීව විද්‍යාව, රසායන විද්‍යාව **සමග** කෘෂි විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් වලින් කුමන හෝ විෂයයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

**නැතහොත්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් පහත සඳහන් විෂයයන් තුනෙන් (03) **එක් වරක දී** සමත්ව තිබිය යුතුය.

- ජෛව පද්ධති තාක්ෂණවේදය (Bio System Technology)
- තාක්ෂණවේදය සඳහා විද්‍යාව (Science for Technology)
- කෘෂි විද්‍යාව (Agriculture Science)

### 4.1.2 වෘත්තීය සුදුසුකම්

1. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වවුනියාව, අනුරාධපුරය සහ කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය ලබා තිබිය යුතුය.

**නැතහොත්**

අම්පාර හාඩි කාර්මික ආයතනය විසින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

**නැතහොත්**

ඇක්වයිනාස් (Aquinas) උසස් අධ්‍යාපන ආයතනයේ කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය ලබා තිබිය යුතුය.

**නැතහොත්**

2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් කෘෂිකාර්මික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් කෘෂිකාර්මික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් කෘෂිකාර්මික සුදුසුකම් ලබා තිබීම.

**නැතහොත්**

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පහත සඳහන් විෂයයන් අතිරින් කුමන හෝ විෂයයක් පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම.

   i. කෘෂි විද්‍යාවේදී උපාධිය [B.Sc (Agriculture)]
   ii. කෘෂි තාක්ෂණ සහ කළමනාකරණ විද්‍යාවේදී උපාධිය [B.Sc (Agriculture Technology and Management)]
   iii. කෘෂි අපනයන විද්‍යාවේදී උපාධිය [B.Sc (Export Agriculture)]
   iv. තාල හා ක්ෂීර තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය [B.Sc (Palm and Latex Technology) ]

**04.2** <u>**කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියේ තනතුරේ අදාළ අධ්‍යාපන සුදුසුකම්**</u>

**4.2.1** ඉහත 4.1.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. (වෘත්තීය සුදුසුකම් අදාළ නොවේ.)

**05. බඳවා ගැනීමේ පරිපාටිය**

05.1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, ඉල්ලා ඇති සියලුම සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සියල්ල කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙළ **(Merit Order)** අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. පත්වීමට අදාළ සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

05.3. කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ප්‍රමාණවත් අයදුම්පත් ප්‍රමාණයක් නොලැබුණු අවස්ථාවල දී පමණක්, නිවේදනයේ **04.2 ඡේදයේ** සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් **කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට** බඳවාගනු ලැබේ.

05.4. එවැනි අවස්ථාවක දී නියමිත දිනට කෘෂිකර්ම උපදේශක තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් උපරිම **30%ක** පුරප්පාඩු සංඛ්‍යාවක් **04.2 ඡේදය** හි සඳහන් සුදුසුකම් සපුරා ඇති තෝරාගන්නා කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියේ අපේක්ෂකයන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

05.5. කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට පත්කරනු ලබන අපේක්ෂකයන් තම වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය සඳහා සම්පූර්ණ වැටුප සමග වසර දෙකහමාරක කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කිරීමෙන් පසුව, බලපැවැත්වෙන සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. කෙසේ වෙතත් අදාළ පාඨමාලාව පුහුණු ශ්‍රේණියට පත්කළ දින සිට වසර තුනක් ඇතුළත සම්පූර්ණ කළ යුතුය.

05.6. ඉහත 05 හි සඳහන් ආකාරයට බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිතවූවන් (ආබාධ සහිත පුද්ගලයින්) සඳහා වෙන් වූ ප්‍රතිශතය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **27/88** හි විධිවිධාන ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරාගැනීමේ දී අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

<u>සටහන</u>

**අයදුම්කරු ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන පුනරුත්ථාපන තත්ත්වය යටතේ නියමිත පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, ආබාධිත පුද්ගලයෙකු නොවන අයදුම්කරුවෙකු තමා ආබාධිත පුද්ගලයෙකු බවට සඳහන් නොකළ යුතුයි.**

## **06.** විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **07.** අයදුම්කිරීමේ පිළිවෙල

07.1. මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

07.2. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/203 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

07.3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

07.4. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

07.5. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **exampPscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

08.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ"** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

## 09. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 10. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 11. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. මෙම විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව, නිගමනවලට එළඹීමට ඇති හැකියාව මෙන්ම සංඛ්‍යා, භාෂාව සහ රූපක ව්‍යුහය ආදිය පිළිබඳ හැකියාව පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>(සංඛ්‍යා, භාෂාව සහ රූපක ව්‍යුහය සහ අන්තර් ක්‍රියා මගින් මතුවන ගැටළු විසඳුම් දෙන ආකාරයෙන්) | පැය 01 | 100 |
| 02 | තාක්ෂණික පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ කෘෂිකර්මයට අදාළ නව්‍ය චින්තනය සහ ගැටළු විසඳීමේ කුසලතා පරීක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් වේ. | පැය 01 | 100 |

<u>සටහන</u>

මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට නම් ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක්වත් **40%** අපේක්ෂකයින් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබාගත් වැඩිම මුළු ලකුණුවල එකතුවේ අනුපිළිවෙල (Merit Order) සළකා බලනු ලැබේ.

## 12. විභාග ප්‍රතිඵල

විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

<u>සැළකිය යුතුය</u>

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

iii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iv. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

v. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෙෙ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.09.30**